# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,108—1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්ද—14.4.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අ. 69 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය** — **සහල් (තොග සහ සිල්ලර)**

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

#### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මෙල්ඩර් ගුණරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) යන වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 11,807 සහ 1959 ජූලි 13 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද අ. 54 සහ 1959 ජූලි 10 වැනි දින දරණ ආහාර මිළ නියෝගය අද්දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2වැනි සහ 3 වැනි තීරවල පිළිවෙලින් සඳහන් වී ඇති මිළ ගණන්, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත සහල් විකිණීමේදී, තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් හා සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට ශුද්ධබර රාත්තලක් විකිණියහැකි වැඩිම සිල්ලර මිළ ගණන්ද වන බව මේ දැන් පටන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාය්‍යී සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්, නියම කරමි.

(4) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයක්ම ඇතුළත කිසිවෙකු විසින් සහල් වෙනත් ද්‍රව්‍යයක් සමඟ හෝ බාල සහල් වර්ගයක් සමඟ හෝ මිශ්‍ර කිරීමෙන් බාලකර නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, සහල් විකිණීමේදී එම සහල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනු ලබන වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද, නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම්කිසි ස්ථානයක සහල් තම ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම මෙම නියෝගයෙන් එකී ප්‍රදේශය සඳහා නියම කරනලද වැඩිම මිළ ගණන සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම තොග වශයෙන් සහල් විකුණන සෑම තැනැත්තෙකුම හා සිල්ලර වශයෙන් සහල් විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය සහ වර්ගය ;

(ඇ) විකුණූ සහල් ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත් නියම කරමි.

(8) එසේම, මෙම නියෝගයේ කාය්‍යී සඳහා ''රාත්තල'' නොහොත් ''රා.'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

1960 අප්‍රියෙල් 11 වෙනි දින පෙරවරු 9.30ට අනුරාධපුරයේදී අත්සන් තබන ලදි.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

437—ජේ: ඇන්. ආර් 9241—4,525 (4/60)

## උප ලේඛනය

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය ශුද්ධබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිළ රු. ශ. | 3 වැනි තීරය ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ රු. ශ. |
|---|---|---|
| අනුරාධපුර නගර සහා සීමාවන් හා අංක 23 සී. දරණ තුලාන | 14 51 | 0 13½ |
| අනුරාධපුර නගර සභා සීමාවන් හැර නුවරගම් කෝරලේ | 14 79 | 0 14 |
| එප්පාවල කෝරලේ | 15 7 | 0 14¼ |
| විලච්චිය කෝරලේ | 15 0 | 0 14¼ |
| කඩවත් කෝරලේ | 15 7 | 0 14¼ |
| අංක 23 සී දරණ තුලාන හැර කනඳරා කෝරලේ | 14 83 | 0 14 |
| කැඳැ කෝරලේ | 15 7 | 0 14 |
| උලගල්ල කෝරලේ | 15 0 | 0 14¼ |
| උඩ්ඩියන්කුලම කෝරලේ | 15 2 | 0 14¼ |
| කල්පේ කෝරලේ | 15 51 | 0 14½ |
| කුන්චුත්තු කෝරලේ | 16 0 | 0 14¾ |
| දකුණු කලාගම් කෝරලේ | 15 56 | 0 14½ |
| උතුරු කලාගම් කෝරලේ | 15 64 | 0 14¾ |
| මාමිනියා කෝරලේ | 15 13 | 0 14¼ |
| නැගම්පහ, කිරලව සහ උඩුරුව යන කෝරළ | 15 97 | 0 15 |
| මහපොතාන කෝරලේ | 15 56 | 0 14¾ |
| මාටඹුවා කෝරලේ | 16 7 | 0 15¼ |

සැළකිය යුතුයි.—මේ මිළ ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ ගණන් නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතා වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

---

කේ. ඩී. 81 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය — සහල් සහ වී.

### 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් නෝසරාජා පුල්ලෙනායගම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාළන පනතේ 4වෙනි වගන්තියත් සමග කියවෙන 3 (2)වෙනි වගන්තියෙන් නියෝජ්‍ය ආහාර මිළ පාලක තැනට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 12,015 හා 1959 යේ දෙසැම්බර මස 21 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් නියමිත අංක කේ. ඩී. 79 සහ 1959යේ දෙසැම්බර් මස 17 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින සිට මීට යාකොට ඇති පළමුවන උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස් වල එම උපලේඛනයේ දෙවෙනි තීරයේ විශේෂිත මිළ ගණන් සුද්ධ බරෙන් සහල් හොණ්ඩරයක් විකිණිය යුතු වැඩිම තොග මිළ ගණන්වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් තොග වශයෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින සිට මීට යාකොට ඇති දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස් වල එම උපලේඛනයේ දෙවන තීරයේ විශේෂිත මිළ ගණන්, සුද්ධ බරෙන් සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිල ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(4) වෙළඳුන්ට තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් වී විකිණීමක් වේ නම් එය සුද්ධ බරින් හොණ්ඩරයක් හෝ රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ සහල් හොණ්ඩරයක් හෝ රාත්තලක් විකිණිය හැකි වැඩිම මිලෙන් බාගයක් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා—

(අ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත් යළිත් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගත යුතු බවත්,

(ආ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත් පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන සුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් හෝ වී ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් සුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්,

(ඈ) රාත්තල හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද,

(ඉ) නියමිත සහල් හෝ වී ප්‍රමාණය යන්නෙන් හැඟවෙන්නේ ආහාර පාලන පනත අනුව එවෙලෙට දිය යුතු සහල් ප්‍රමාණය බවද මෙයින් නියෝග කරමි.

(6) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් සහ වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යයක් කලවම් කොට බාලකොට කිසිවෙක් සහල් හෝ වී නොවිකිණිය යුතු බව නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සහල් හෝ වී සිය සවාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගත සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සහල් හෝ වී වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සහල් හෝ වී වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ, උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක ලියා එම භාජනයට ඇඳා එම සහල් හෝ වී ද මිළ පුවරුවද ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී කිසි කෙනෙක් තොග වශයෙන් විකිණීමක් කළේ නම් ඒ මිළ දී ගන්නා තැනැත්තාට පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) සහල් හෝ වී විකුණූ ප්‍රමාණය (බර අනුවයි);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම සිල්ලර වශයෙන්ද තොග වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බව නියම කරමි.

තවද සිල්ලර වශයෙන් මිළ දී ගන්නෙකු වුවද එසේ කුවිතාන්සියක් ඉල්ලුවහොත් එය දියයුතු බවද මෙයින් නියම කරමි.

(9) සහල් හෝ වී විකිණීමේදී එය යම් කිසි දෙයක බහා ලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිළත් මේ නියෝගයෙන් නියමිත මිළ ගණන් වලට ඇතුලත් බව මෙයින් නියම කරමි.

1960 අප්‍රියෙල් මස 11 වෙනි දින අපරභාග 12.25ට මහනුවර දීය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිළධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාළක තැන.

## පළමුවන උපලේඛනය

| පළමුවන තීරය<br>පෙදෙස | දෙවන තීරය<br>සුද්ධ කිරුමෙන් හොණ්ඩර යක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| (අ) මහනුවර දිස්ත්‍රික්කය : | |
| (1) මහනුවර නාගරිකය සහ ගඟවට කෝරළය ... ... | 13 87 |
| උඩුනුවර සහ යටිනුවර : | |
| (2) කටුලියද්ද ... ... ... ... | 13 88 |
| (3) ගෙලිඔය ... ... ... ... | 13 97 |
| (4) පිටුනුගම, දනබතුරේ, මැණික්දිවෙල, දව්ලගල ... ... | 14 01 |
| (5) වේගිරිය, මුරුතලාව ... ... ... | 13 99 |
| (6) වට්ටප්පොල ... ... ... | 14 11 |
| (7) කඩුගන්නාව ... ... ... | 13 88 |
| (8) ඊරියගම, පේරාදෙනිය ... ... ... | 13 89 |
| (9) බත්ගොඩපිටිය ... ... ... | 14 06 |
| (10) පොත්තපිටිය ... ... ... | 14 01 |
| (11) අලකොලඅන්ගෙ ... ... ... | 13 93 |
| කුම්පනේ : | |
| (12) ගලගෙදර ... ... ... ... | 14 24 |
| (13) හතරලියද්ද ... ... ... ... | 14 07 |
| හාරිස්පත්තුව : | |
| (14) අරඹේකඩේ, පූජාපිටිය, කුරුගොඩ ... ... | 14 11 |
| (15) හැදෙනිය, කුලුගම්මන, විගුහුම්පොල, අකුරණ, වැරැල්ලගම ... | 14 06 |
| (16) බරිගම ... ... ... ... | 14 01 |
| (17) යටිවාවල ... ... ... ... | 13 97 |
| (18) වෙලේකඩේ ... ... ... | 14 01 |
| (19) පලිපාන ... ... ... ... | 14 21 |
| (20) අලවතුගොඩ ... ... ... | 14 19 |
| (21) ගල් හින්න, අන්කුඹුර ... ... ... | 14 50 |
| පාතදුම්බර : | |
| (22) වත්තේගම ... ... ... ... | 14 01 |
| (23) තෙල්දෙනිය ... ... ... | 14 31 |
| (24) පන්විල ... ... ... ... | 14 23 |
| (25) මඩවල ... ... ... ... | 14 10 |
| (26) නවයලතැන්න, කටුගස්තොට ... ... | 13 89 |
| (27) පරණගම ... ... ... ... | 14 29 |
| (28) හුලුගඟ ... ... ... ... | 14 45 |
| (29) කෙන්ගල්ල ... ... ... | 14 36 |
| (30) දිගන ... ... ... ... | 14 27 |
| (31) අඹතැන්න, කුඩුගල ... ... ... | 13 97 |
| (32) මැනික්හින්න ... ... ... | 14 20 |
| මැදදුම්බර : | |
| (33) මැදදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරි තැනගේ කොට්ඨාශය | 14 46 |
| උඩදුම්බර : | |
| (34) උඩදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිලධාරි තැනගේ කොට්ඨාශය | 14 81 |
| පාතහේවාහැට : | |
| (35) මාරස්සන ... — ... ... | 14 41 |
| (36) පටියගම කඩමන්ඩිය, දෙල්තොට ... ... | 14 53 |
| (37) තලාතුඔය ... ... ... ... | 14 0 |
| (38) ගලහා ... ... ... ... | 14 36 |
| (39) අම්පිටිය ... ... ... ... | 14 15 |

| පළමුවන තීරය<br>පෙදෙස | දෙවන තීරය<br>ශුද්ධ කිරුමෙන් හොඬ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **උඩපලාත :** | |
| (40) ගම්පොල ... ... ... ... | 13 84 |
| (41) උලපනේ ... ... ... ... | 14 08 |
| (42) පුස්සැල්ලාව... ... ... ... | 14 32 |
| (43) උඩුවැල්ල ... ... ... ... | 14 63 |
| (44) කලුගොමුව ... ... ... ... | 14 15 |
| (45) මුල්ගම ... ... ... ... | 14 50 |
| **උඩබුලත්ගම :** | |
| (46) නාවලපිටිය ... ... ... ... | 14 10 |
| (47) හැටන් ... ... ... ... | 14 27 |
| (48) නෝර්වුඩ් ... ... ... ... | 14 48 |
| (49) බගවන්තලාව ... ... ... | 14 83 |
| (50) ගිනිගත්හේන ... ... ... | 14 57 |
| (51) මස්කෙලිය, අක්කරවත්ත, නෝර්ටන්බ්‍රිජ්, හාඩ්න්හුයිස් ... | 14 81 |
| **නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශය :** | |
| (52) පදියපැලැල්ල ... ... ... | 14 67 |
| (53) මතුරට ... ... ... ... | 14 95 |
| (54) මානකොල ... ... ... ... | 14 67 |
| (55) රිකිල්ලගස්කඩ ... ... ... | 14 57 |
| (56) රහතුන්ගොඩ ... ... ... | 14 64 |
| (57) හගුරන්කෙත ... ... ... | 14 46 |
| (58) මුදුනපිටිය ... ... ... ... | 14 67 |
| (59) කරලියද්ද ... ... ... ... | 14 78 |

## දෙවන උපලේඛනය

| පළමුවන තීරය<br>ප්‍රදේශය | දෙවන තීරය<br>ශුද්ධ බරින් රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ<br>ශත |
|---|---|
| 1. (අ) මහනුවර නාගරිකය | |
| (ආ) ගහවට කෝරළය | |
| (ඇ) දෙල්තොට, බව්ලාන, පටියගම පල්ලෙගම, පටියගම උඩගම, පටියගම ගබඩගම, නවනැලිය සහ බෝපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශය හැර පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරි තැනගේ කොට්ඨාශයේ අනිකුත් ප්‍රදේශ ... ... ... ... ... | 0 13 |
| 2. පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම්පාළක නිළධාරි තැනගේ කොට්ඨාශයේ දෙල්තොට, පටියගම උඩගම, පටියගම පල්ලෙගම, පටියගම ගබඩගම, නවනැලිය සහ බෝපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... | 0 13½ |
| 3. උඩුනුවර, යටිනුවර, තුම්පනේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදයම් පාලක නිළධාරීන්ගේ කොට්ඨාශ, කුඹුක්කඳුර, කෙන්ගල්ල වසම දෙක හැර පාතදුම්බර ප්‍රාදේශීය ආදයම්පාළක නිළධාරීන්ගේ කොට්ඨාශයේ අනික් ප්‍රදේශ, උඩබුලත්ගම ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරීන්ගේ කොට්ඨාශයේ නාවලපිටිය සහ පෙනිතුඩුව වසම දෙක, උඩපළාත ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරීන්ගේ කොට්ඨාශයේ අටබාගේ ඉහලගම, දූනුකෙඋල, උඩුවැල්ල යන වසම් හැර අනික් ප්‍රදේශ ... ... ... ... ... | 0 13 |
| (අ) පාතදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරි තැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශවන කුඹුක්කඳුර සහ කෙන්ගල්ල | 0 13½ |
| (ආ) උඩපළාත ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන අටබාගෙ ඉහල ගම, දූනුකෙඋල, උඩුවැල්ල සහ උඩ බුලත්ගම ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන පල්ලෙගම, කඩියන්ලෙන, අඹගමුව, හෝමාගම, කඩවෙල, උතුරු යටිගන්හුලහ, දකුණු යටිගන් හුලහ, හැටන්, දික්කොය, නෝර්වුඩ්, මස්කෙලිය, රඹුක්පිටිය ... ... ... | 0 13½ |
| 4. (අ) උඩබුලත්ගම ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන මාපාකන්ද, වෙලිගම් පොල, හන්ගරපිටිය, දෙකින්ද, සහ මොරහේනේගම ... ... ... | 0 14½ |
| (ආ) උඩබුලත්ගම ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන පොල්පිටිය ... | 0 15½ |
| (ඇ) උඩබුලත්ගම ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන අක්කරවත්ත, කිරිවන් නැලිය, සහ බොගවන්තලාව ... ... ... ... ... | 0 14 |
| 5. (අ) ගිඩ්ඩාව, සහ උඩගම්මැද්ද යන ගම්මුලාදෑනි කොට්ඨාශ හැර මැද දුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ කොට්ඨාශයේ අනිකුත් ප්‍රදේශ ... ... ... ... ... | 0 13½ |
| (ආ) මැදදුම්බර ප්‍රාදේශීය ආදයම්පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන උඩගම්මැද්ද ... | 0 14 |
| (ඇ) මැදදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම් මුලාදෑනි කොට්ඨාශ වන ගිඩ්ඩාව ... ... | 0 13¾ |
| 6. (අ) උඩදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරිතැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන මීමුරේ සහ උඩැත්තෑව ... | 0 15 |
| (ආ) උඩදුම්බර ප්‍රාදේශීය ආදයම් පාළක නිළධාරි තැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන කන්දපහල කෝරළේ ... | 0 14½ |
| (ඇ) උඩදුම්බර කොට්ඨාශයේ ඉහත සඳහන් 6 (අ) සහ 6 (ආ) යන අංකයන්හි දක්වා නැති ප්‍රදේශ ... | 0 14 |
| 7. (අ) නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශයට අයත් මල්උල්ල, මුදුනපිට කඩ මන්දිය, කොහොක කෝරලේ, ඇකිරිය සහ වෑගම යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... | 0 13½ |
| (ආ) නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් පාලක නිළධාරිතැනගේ කොට්ඨාශයේ 7 (අ) වැනි අංකයේ සඳහන් නැති ප්‍රදේශ ... ... ... ... ... | 0 14 |

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් මිළ ගණන් සහල් විකිණීමේ නියමිත මිළ නොවේ. ඒවා සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. ඒ මිළ ගණන් වලට වඩා ඉහළින් සහල් විකිණිය යුත්තේ නොවේ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.